විද්‍යා තාක්ෂණ හා පර්යේෂණ අමාත්‍යාංශය
කාර්මික තාක්ෂණ ආයතනය
363, බෞද්ධාලෝක මාවත, කොළඹ 07

විද්‍යා තාක්ෂණ හා පර්යේෂණ අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක වන ව්‍යවස්ථාපිත ආයතනයක් වන කාර්මික තාක්ෂණ ආයතනය (ITI) (මින් පෙර ලංකා විද්‍යාත්මක සහ කාර්මික පර්යේෂණ ආයතනය (CISIR) ලෙස හැදින්විණි.) පර්යේෂණ සහ සංවර්ධන, ගිවිසුම්, උපදේශනය,පුහුණු සහ තාක්ෂණික සේවාවන් තුළින් කාර්මික සංවර්ධනය ප්‍රවර්ධනයේ ලා කැපවී සිටින පර්යේෂණ ආයතනයකි.

ආයතනයේ පහත තනතුරු සඳහා කාර්යශූර, කාර්යක්ෂම සහ විචක්ෂණශීලි අපේක්ෂකයන් අපේක්ෂා කරන අතර වඩාත් සුදුසු අයදුම්කරුවන් ඒ සඳහා තෝරා ගනු ලැබේ. අවශ්‍ය සුදුසුකම් සහ පලපුරුද්ද සපුරා ඇති ශ්‍රී ලංකා පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවා සිටී.

## 1. විදුලි කාර්මික (Electrician) - PL 3- III

**සුදුසුකම්**

**බාහිර අයදුම්කරුවන් සඳහා**

තෘතිය හා වෘත්තිය අධ්‍යාපන කොමිසන් සභාව විසින් පිළිගත් කාර්මික/වෘත්තීය ආයතනයක් විසින් අදාළ ක්ශේත්‍රය/ක්ෂේත්‍රයන්ට අදාළව පවත්වනු ලබන ජාතික වෘත්තීය යෝග්‍යතා 4 මට්ටමට නොඅඩු මට්ටමක ප්‍රවීණතා සහතිකයක් ලබා තිබීම.

**රැකියා විස්තරය**

- ප්‍රමිතීන්ට හා රෙගුලාසීන්ට අනුව විදුලි රැහැන් ඇදීමේ කටයුතු ඉටු කිරීම.
- පරීක්ෂණ, අත්හදාබැලීම්, බිඳවැටීම් හඳුනා ගැනීම සහ විදුලි සවිකිරීම්හි අලුත්වැඩියා කටයුතු ඉටුකිරීම.
- විදුලි මෝටර්,පාලක පුවරු අලුත්වැඩියා කිරීම/සේවා සැපයීම.
- විදුලි/විද්‍යුත් පාලන පද්ධතීන් සවි කිරීම/සේවා සැපයීම/අලුත්වැඩියා කිරීම හෝ වෙනත් ඒවා සවිකිරීම.
- ආසන්නතම අධීක්ෂක/අංශ ප්‍රධානී විසින් පවරනු ලබන වෙනත් ඕනෑම රාජකාරි.

## 2. වැද්දුම්කරු (Fitter) - PL 3- III

**සුදුසුකම්**

**බාහිර අයදුම්කරුවන් සඳහා**

තෘතිය හා වෘත්තිය අධ්‍යාපන කොමිසන් සභාව විසින් පිළිගත් කාර්මික/වෘත්තීය ආයතනයක් විසින් අදාළ ක්ශේත්‍රය/ක්ෂේත්‍රයන්ට අදාළව පවත්වනු ලබන ජාතික වෘත්තීය යෝග්‍යතා 4 මට්ටමට නොඅඩු මට්ටමක ප්‍රවීණතා සහතිකයක් ලබා තිබීම.

**රැකියා විස්තරය**

- දෙන ලද උපදෙස් සැලසුම් සටහන් හා රූපසටහන් අනුව ලෝහ තහඩු /නළ වායු හා ආර්ක් පෑස්සුම් කටයුතු.
- දෙන ලද උපදෙස් සැලසුම් සටහන් හා රූපසටහන් අනුව තහඩු හා ලෝහ කොටස් වායු මගින් කැපීම.
- දෙන ලද උපදෙස් සැලසුම් හා සැකිලි අනුව පෑස්සීම සඳහා වැඩකොටස් සූදානම් කිරීම.
- සම්පූර්ණ කරන ලද කාර්ය කොටස්, පටි(බෙල්ට්)මෙහෙයුම් ආම්පන්න සහ නළමාර්ග එක්කිරීම.
- වැඩපල වැද්දුම් කටයුතු/ලියවන පට්ටල් වැඩ.
- දෙන ලද උපදෙස් සැලසුම් සටහන් හා රූප සටහන් අනුව වැඩ කොටස් සැකසීම.
- විදුලි මෝටර් මෙහෙයුම් බෙල්ට් බෙයාරින් පොම්ප සහ නළ මාර්ග එක් කිරීම සහ සවි කිරීම් සැලසුම් කටයුතු.
- ආන්නතම අධීක්ෂක /අංශ ප්‍රධානි විසින් පවරනු ලබන අන් කවරම හෝ රාජකාරි.

## 3. <u>වඩු කාර්මික ශිල්පී (Carpenter) - PL 3- III</u>

**සුදුසුකම්**

**බාහිර අයදුම්කරුවන් සඳහා**

තෘතිය හා වෘත්තිය අධ්‍යාපන කොමිසන් සභාව විසින් පිළිගත් කාර්මික/වෘත්තීය ආයතනයක් විසින් අදාළ ක්ශේත්‍රය/ක්ෂේත්‍රයන්ට අදාළව පවත්වනු ලබන ජාතික වෘත්තීය යෝග්‍යතා 4 මට්ටමට නොඅඩු මට්ටමක ප්‍රවීණතා සහතිකයක් ලබා තිබීම.

**රැකියා විස්තරය**

- දෙන ලද උපදෙස් සැලසුම් සටහන් හා සැකිලි අනුව වඩු කාර්යයන් ඉටු කිරීම.
- වාර්නිෂ් කිරීම, පින්තාරු කිරීම ඇතුළුව වෙන් කිරීම, සිවිලිම, වහල, පරීක්ෂණාගාර මේස වැනි දෑ සම්බන්ධව දැවමය කාර්යයන් ඉටුකිරීම.
- ලී බඩු සහ දැව මත පදනම් වන භාණ්ඩ නිෂ්පාදනය.
- ආසන්නතම අධීක්ෂක /අංශ ප්‍රධානි විසින් පවරනු ලබන අන් කවරම හෝ රාජකාරි.

## 4. <u>ජලනල කාර්මික ශිල්පී (Plumber) - PL 3- III</u>

**සුදුසුකම්**

**බාහිර අයදුම්කරුවන් සඳහා**

තෘතිය හා වෘත්තිය අධ්‍යාපන කොමිසන් සභාව විසින් පිළිගත් කාර්මික/වෘත්තීය ආයතනයක් විසින් අදාළ ක්ශේත්‍රය/ක්ෂේත්‍රයන්ට අදාළව පවත්වනු ලබන ජාතික වෘත්තීය යෝග්‍යතා 4 මට්ටමට නොඅඩු මට්ටමක ප්‍රවීණතා සහතිකයක් ලබා තිබීම.

**රැකියා විස්තරය**

- කාර්මික තාක්ෂණ ආයතනයේ ජලය බෙදා හැරීම, අප ජලය බැහැරලීම හා ජලප්‍රවාහන කටයුතු සඳහා භාවිතා කෙරෙන නළ ,සවිකිරීම් හා අනෙක් නළ උපකරණ සවි කිරීම,නඩත්තුව අලුත් වැඩියා කිරීම හා පින්තාරු කිරීම.
- ආසන්නතම අධීක්ෂක /අංශ ප්‍රධානි විසින් පවරනු ලබන අන් කවරම හෝ රාජකාරි.

## 5. බෙලෙක්කරු (Tinker) - PL 3- III

**සුදුසුකම්**

**බාහිර අයදුම්කරුවන් සඳහා**

තෘතිය හා වෘත්තිය අධ්‍යාපන කොමිසන් සභාව විසින් පිළිගත් කාර්මික/වෘත්තීය ආයතනයක් විසින් අදාළ ක්ශේත්‍රය/ක්ෂේත්‍රයන්ට අදාළව පවත්වනු ලබන ජාතික වෘත්තීය යෝග්‍යතා 4 මට්ටමට නොඅඩු මට්ටමක ප්‍රවීණතා සහතිකයක් ලබා තිබීම.

**රැකියා විස්තරය**

- පින්තාරු කිරීම ද ඇතුළුව වාහන, උපකරණ හා වානේ ගෘහභාණ්ඩ වලට අදාළ තහඩු පැස්සිමේ/ටින්කර් කටයුතු.
- ආසන්නතම අධීක්ෂක /අංශ ප්‍රධානි විසින් පවරනු ලබන අන් කවරම හෝ රාජකාරි.

## 6. මෝටර් කාර්මික ශිල්පී (Motor Mechanic) - PL 3- III

**සුදුසුකම්**

**බාහිර අයදුම්කරුවන් සඳහා**

තෘතිය හා වෘත්තිය අධ්‍යාපන කොමිසන් සභාව විසින් පිළිගත් කාර්මික/වෘත්තීය ආයතනයක් විසින් අදාළ ක්ශේත්‍රය/ක්ෂේත්‍රයන්ට අදාළව පවත්වනු ලබන ජාතික වෘත්තීය යෝග්‍යතා 4 මට්ටමට නොඅඩු මට්ටමක ප්‍රවීණතා සහතිකයක් ලබා තිබීම.

**රැකියා විස්තරය**

- එන්ජිම, එන්ජිම සිසිලන පද්ධතිය, ඉන්ධන පද්ධතිය, තිරිංග පද්ධතිය, සුක්කානම් පද්ධතිය අතුලුව මෝටර් වාහනවල අලුත්වැඩියාවන් සිදු කිරීම හා දෝෂ හදුනා ගැනීම.
- රෝද සමබර කිරීම රෝද එක් එල්ලේ තැබීම.
- එන්ජිමේ සමස්ත පරික්ෂාව.
- පණගැන්වීම, විදුලි ආරෝපණ හා අනෙක් විද්‍යුත් පරිපතවල අලුත්වැඩියා හා සේවාවන්.
- ආසන්නතම අධීක්ෂක /අංශ ප්‍රධානි විසින් පවරනු ලබන අන් කවරම හෝ රාජකාරි.

## 7. රසායනාගාර සේවක ( Laboratory Attendant) - PL 2 –III

**සුදුසුකම්**

**බාහිර අයදුම්කරුවන් සඳහා**

අ.පො.ස. සාමාන්‍ය පෙළ විෂයන් 06 ක් සමත්වීම සහ තෘතිය හා වෘත්තිය අධ්‍යාපන කොමිසන් සභාව විසින් පිළිගත්,කාර්මික වෘත්තිය පුහුණු ආයතනයක් විසින් පවත්වනු ලබන ජාතික වෘත්තිය යෝග්‍යතා 2 මට්ටමට නොඅඩු තනතුරට අදාළ කාර්යයට අනුකූලව සහතික පත්‍ර පාඨමාලාවක් සම්පූර්ණ කර තිබීම.

**රැකියා විස්තරය**

- විද්‍යාගාර උපකරණ ඇතුළුව විද්‍යාගාරය/කාර්යාලය පිරිසිදු කිරීම සහ ආයතනයේ තත්වය පද්ධතියට අනුව යහපත් පරිශ්‍ර පාලනයක් පවත්වාගෙන යාම.
- විද්‍යාගාර රසායනයන්, උපකරණ හා විද්‍යාගාර/කාර්යාල උපකරණ ආරක්ශිතව හැසිරවීම.
- දෛනික රාජකාරි, අත්හදාබැලීම්/පරීක්ෂණ, ක්ශේත්‍ර පරික්ෂා,අලුත්වැඩියා හා නඩත්තු යනාදිය ඉටු කිරීමේදී කාර්යාල/විද්‍යාගාර කාර්ය මණ්ඩලයට සහාය වීම.
- පරිගණක සාක්ෂරතාව අත්කරගෙන සිටිය යුතුය.
- දෛනික කාර්යාල ක්‍රියාකාරකම් පිළිබඳ දැනුවත්බව.
- ආසන්නම අධික්ෂක/අංශ ප්‍රධානි විසින් පවරනු ලබන අන් කවර හෝ රාජකාරි.

## 8. වැඩ කම්හල් සේවක ( Workshop Attendant) - PL 2 –III

**සුදුසුකම්**

**බාහිර අයදුම්කරුවන් සඳහා**

අ.පො.ස. සාමාන්‍ය පෙළ විෂයන් 06 ක් සමත්වීම සහ තෘතිය හා වෘත්තිය අධ්‍යාපන කොමිසන් සභාව විසින් පිළිගත්,කාර්මික වෘත්තිය පුහුණු ආයතනයක් විසින් පවත්වනු ලබන ජාතික වෘත්තිය යෝග්‍යතා 2 මට්ටමට නොඅඩු තනතුරට අදාළ කාර්යයට අනුකූලව සහතික පත්‍ර පාඨමාලාවක් සම්පූර්ණ කර තිබීම.

**රැකියා විස්තරය**

- වැඩකම්හල පිරිසිදු කිරීම හා ආයතනයේ තත්වය පද්ධතියට අනුව යහපත් පරිශ්‍ර පාලනයක් පවත්වාගෙන යාම.
- පරිගණක, වැඩ කම්හල් උපකරණ,යන්ත්‍ර,කාර්යාල උපකරණ ආරක්ෂිතව හැසිරවීම.
- දෛනික රාජකාරි/වැඩ කම්හල් රාජකාරි,ක්ෂේත්‍ර පරීක්ෂණ, අලුත් වැඩියා හා නඩත්තු යනාදිය ඉටු කිරීමේදී කාර්යාල මණ්ඩලයට සහය වීම.
- පරිගණක සාක්ෂරතාවය අත්කරගෙන සිටිය යුතුය.
- දෛනික කාර්යාල ක්‍රියාකාරකම් පිලිබඳව දැනුවත් බව.
- ආසන්නම අධික්ෂක/අංශ ප්‍රධානි විසින් පවරනු ලබන අන් කවර හෝ රාජකාරි.

9. <u>සහායක (Helper) - PL 1 –III</u>

**සුදුසුකම්**

**බාහිර අයදුම්කරුවන් සඳහා**

අවම වශයෙන් අ.පො.ස.(සා.පෙ) විභාගයෙන් විෂයයන් දෙකක් සමත්ව සිටිය යුතුය.

**රැකියා විස්තරය**

- පොදු පවිත්‍රතා කටයුතු ඉටු කිරීම හා පවත්වාගෙන යාම.
- ලිපි/වාර්තා/ලේඛන බෙදා හරිම.
- කාර්යාල රාජකාරි ඉටුකිරීමෙහිලා කාර්යමණ්ඩලයට සහාය වීම
- අංශය/ශාඛාව විසින් පවරනු ලැබිය හැකි අන් කවර හෝ රාජකාරි.

❖ වයස

වයස අවුරුදු 18 ට නොඅඩු සහ අවුරුදු 45 ට නොවැඩි විය යුතුය.

ඉහත වයස් සීමාව රජයේ දෙපාර්තමේන්තු/සංස්ථාවල සේවකයන්ට අදාළ නොවේ.

**වැටුප් පරිමාණ**

PL 3 – III : රු.43,280-10X490-10X540-10X590-12X630-67,040/- (w.e.f 01.01.2027)
මූලික වැටුප් පියවර රු.38,387/- සහ රජයේ අනුමත දීමනා

PL 2 – III : රු.42,300-10X490-10X540-10X590-12X630-66,060/- (w.e.f 01.01.2027)
මූලික වැටුප් පියවර රු.37,715/- සහ රජයේ අනුමත දීමනා

PL 1 – III : රු.40,500-10X450-10X490-07X540-15X590-62,530/- (w.e.f 01.01.2027)
මූලික වැටුප් පියවර රු.36,475/- සහ රජයේ අනුමත දීමනා

( 2025.03.25 දිනැති කළමනාකරණ සේවා චක්‍රලේඛ අංක 01/2025 හි විධි විධාන අනුව)

**ඉහත තනතුරු සඳහා අදාළ වන වෙනත් ප්‍රතිලාභ**

- අයදුම්පත ඉදිරිපත් කිරීමේදී ITI වෙබ් අඩවියේ (www.iti.lk) දී ඇති ආකෘතිය භාවිතා කරන ලෙස අයදුම්කරුවන්ගෙන් ඉල්ලා සිටී. ඉහත අවශ්‍යතාවයන්ට අනුකූල නොවන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.
- තෝරා ගැනෙන අපේක්ෂකයන් කාර්ය සාධන පදනම් දිරිදීමනා, දායකත්ව වෛද්‍ය රක්ෂණ ක්‍රමය සහ ආයතනය මඟින් ක්‍රියාත්මක කරනු ලබන වෙනත් ප්‍රතිලාභ ක්‍රම සඳහා හිමිකම් ලබයි.
- ආයතනය එයටම විශේෂිත අර්ථ සාධක අරමුදල් ක්‍රමයක් පවත්වා ගෙන යනු ලබන අතර එයට සේවකයාගේ දළ වැටුපෙන් 10% ක සහ ආයතනයේ 15% ක දායකත්වයක් ලබා ගැනේ. මීට අමතරව සේවයා විසින් සේවා නියුක්ති භාරකාර අරමුදලට වැටුපෙන් 3% ක දායකත්වයක් සපයනු ලැබේ.

- දැනට රජයේ දෙපාර්තමේන්තු/රාජ්‍ය සංස්ථා/ව්‍යවස්ථාපිත මණ්ඩලවල සේවය කරන අයදුම්කරුවන් තම ආයතනවල ප්‍රධානීන් මගින් තම අයදුම්පත් යොමු කළ යුතුය. අයදුම්පතේ පෙර පිටපතක් කෙළින්ම යොමු කළ හැකිය.
- නිසි ලෙස සම්පූර්ණ කරන ලද අයදුම්පත්,අධ්‍යාපන,වෘත්තීය සුදුසුකම් සහ පළපුරුද්ද දැක්වෙන සහතිකවල ඡායාපිටපත් සහ විමසිය යුතු පුද්ගලයන් දෙදෙනෙකුගේ(ඥාතීන් නොවන) නම් සහ ලිපිනය සහිතව පහත දක්වා ඇති දිනට 2025.09.01 හෝ එදිනට පෙර (advanced copy) ලියාපදිංචි තැපෑලෙන් යොමු කළ යුතුය.
- අයදුම්පත යොමු කරනු ලබන තනතුර ලියුම්කවරයේ ඉහළ වම් කෙළවරේ සඳහන් කළ යුතුය.

**අධ්‍යක්ෂ ජනරාල්**
**කාර්මික තාක්ෂණ ආයතනය**
**363,බෞද්ධාලෝක මාවත,**
**කොළඹ 07 .**
**www.iti.lk**